**27-11-2024 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, මෙම සීමිත ලෝකයේ නිෂ්ඵල දේවල් වෙනුවෙන් ඔබගේ කාලය අපතේ නොහරින්න. ඔබගේ බුද්ධිය තුළ නිරන්තරයෙන් රාජකීය සිතිවිලි තබා ගන්න.

**ප්‍රශ්නය:** පරම පියා ලබා දෙන සෑම උපදෙසක්ම ක්‍රියාවට නැංවිය හැක්කේ කුමන දරුවන්ටද?

**පිළිතුර:** ඇතුලාන්තයට යොමු වී සිටින සහ කිසිම බාහිර ආටෝපයක් නොපෙන්වා ඒ වෙනුවට ආධ්‍යාත්මික කුල්මත් බවේ සිටින අයට පියාගේ සෑම උපදේශයක්ම ක්‍රියාවට නැංවිය හැක. ඔය දරුවන් තුළ කිසිම පුහු මානයක් නොතිබිය යුතුයි. ඔබ තුළ සම්පූර්ණ පිරිසිදුකම තිබිය යුතුයි. ඔය ජීවාත්ම ඉතා යහපත් වී ඔබ තුළ සත්‍ය සෙනෙහස තිබිය යුතුයි. ලුණු වතුර වැනි සංස්කාර කිසිම විටෙක නොතිබිය යුතුයි, මන්ද, ඔබට පරම පියාගේ සෑම උපදෙසක්ම ක්‍රියාවට නැංවීමට හැකි වන්නේ එවිට පමණයි.

ඕම් ශාන්ති. ඔය දරුවන් අසුන්ගෙන සිහි කිරීමේ වන්දනා ගමනේ යනවා පමණක් නොව, නමුත් ශ්‍රීමත් පිළිපැදීමෙන් ඔබ සුරදූතයන්ගේ දේශය (පරිස්ථාන්) ස්ථාපිත කරන බවට ආධ්‍යාත්මික කුල්මත් බවත් ඔබට තිබෙනවා. ඔබ තුළ බොහෝ සතුට සහ උද්යෝගය තිබිය යුතුයි. මේ වන විට සියලු වැඩකට නැති දේවල් සහ කසල ඉවත් වී තිබිය යුතුයි. අසීමිත පියාව දැකීමෙන් ඔබ තුළ විශාල උද්යෝගයක් තිබිය යුතුයි. ඔබ වැඩියෙන් සිහිපත් කිරීමේ වන්දනා ගමනේ රැඳී සිටින තරමට වැඩි ප්‍රගතියක් ඇති වෙයි. ඔය දරුවන් වෙනුවෙන් ආධ්‍යාත්මික විශ්ව විද්‍යාලයක් තිබිය යුතු බව පරම පියා පවසයි. ඔබගේ වන්නේ ලෝක ආධ්‍යාත්මික විශ්ව විද්‍යාලයයි. එසේ නම් මෙම විශ්ව විද්‍යාලය තිබෙන්නේ කොහෙද? ඔබ වෙනුවෙන් විශේෂයෙන් විශ්ව විද්‍යාලයක් නිර්මාණය කෙරෙනවා. එය සමගම බොහෝ රාජකීය නේවාසිකාගාරයක්ද තිබිය යුතුයි. ඔබගේ සිතිවිලි බොහෝ රාජකීය විය යුතුයි. දිවා රාත්‍රියේ ඔය දරුවන්ට උගන්වන්නේ කෙසේද සහ ඔබ ලෝකයේ පාලකයන් බවට පත්වන එම උසස්ම විභාග වලින් සමත් කරවන්නේ කෙසේද ගැන පියා සිතයි. ආදිතම කාලයේ ඔය ජීවාත්ම සම්පූර්ණයෙන් පිවිතුරුව සිටි අතර එබැවින් ඔබගේ ශරීරත් සම්පූර්ණයෙන් පිවිතුරු සහ අලංකාරව තිබුණා. ඔබට බොහෝ ශ්‍රේෂ්ඨ රාජධානියක් තිබුණා. මෙම සීමිත ලෝකයේ වැඩකට නැති දේවල් වෙනුවෙන් ඔබගේ බොහෝ කාලය අපතේ යයි. ඔය ශිෂ්‍යයන් තුළ කිසිම කිලිටි සිතිවිල්ලක් නොතිබිය යුතුයි. ඔබ ඉතා හොඳ කම්වු බොහොමයක් ඇති කරයි, නමුත් යෝගාවේ බලය නොමැත. ඔබ මේ දේවල්, අර දේවල් කරන්නේ කෙසේද කියා එකිනෙකාට බොහෝ මුසා කතා ගොතා කියයි. මායාද පවසන්නේ: මා ඔවුන්ගේ නාසයෙන් හෝ කන් දෙකෙන් ඔවුන්ව අල්ලා ගන්නම්. පියා කෙරෙහි සෙනෙහස නොමැත. මෙවන් කියමනකි, "මනුෂ්‍යයන්ට සිදුවීමට අවශ්‍ය දේ එකක් නමුත් සිදු වන්නේ වෙනත් දෙයක්". එබැවින් මායාද ඔබට කිසිවක් කිරීමට ඉඩ නොදෙයි. මායා ඔබව බොහෝ සේ මුලා කරයි; ඇය ඔබගේ කන් දෙක කපා දමයි. පියා ඔය දරුවන්ව බොහෝ ශ්‍රේෂ්ඨ කරවයි. ඔහු ඔබට යම් යම් දේවල් කරන්නට කියා උපදෙස් ලබා දෙයි. බාබා ඉතාම රාජකීය දියණියන්ව සේවය කිරීමට පිටතටද යවයි. සමහර දරුවන් බාබාගෙන් මෙසේ විමසයි: බාබා, අපි පුහුණු වීමට යා යුතුද? බාබා පවසන්නේ : දරුවනේ, ප්‍රථමයෙන් තමන්ගේම දුර්වලතා ඉවත් කරගන්න. තමන්ව පරීක්ෂා කර බලන්න: මට කෙතරම් දුර්වලතා තිබෙනවාද? මායා, ශ්‍රේෂ්ඨ මහාරතීන්වත් ලුණු වතුර බවට පත් කරවයි. පියාව කිසිසේත් සිහි නොකරන එවන් ලුණු වතුර වැනි දරුවන් සිටියි. ඔවුන් මෙම දැනුමේ "අ යනු ආ යන්න" වත් තවම නොදනී. ඔවුන් විශාල බාහිර ආටෝපයක් පෙන්වයි. මෙහි, ඔබ බොහෝ ඇතුලාන්තයට යොමු වී සිටිය යුතුයි. කෙසේවෙතත්, ඔබගෙන් සමහර දරුවන් හැසිරෙන්නේ නූගතුන් ලෙසයි. සමහර මිනිසුන්ට සුළු මුදල් ප්‍රමාණයක් තිබෙන විටත් ඔවුන් බොහෝ කුල්මත් වෙයි. ඔවුන් සම්පූර්ණයෙන් බංකොලොත් බව ඔවුන්ට වැටහෙන්නේ නැහැ. ඔවුන්ට මෙය වටහා ගැනීමට මායා ඉඩ නොදෙයි. මායා බොහෝ සේ බලවත්ය. බාබා ඔවුන්ව සුළු වශයෙන් ප්‍රශංසා කළත් ඔවුන් ඉන් බොහෝ සතුටු වනවා. ඔය දරුවන්ට හොඳින් ඉගෙන ගත හැකි අංක එකේ විශ්ව විද්‍යාලයක් තිබිය යුතු බව, බාබා දිවා රෑ සිතයි. ඔබ දිව්‍යලෝකයට යන බව දන්නා නිසා ඔබගේ සතුටේ අංශක බොහෝ ඉහළින් තිබිය යුතුයි. ඔබව කුල්මත් බවින් තබා ගැනීමට බාබා ඔබට විවිධ මාත්‍රා ලබා දෙයි. බංකොලොත් පුද්ගලයෙක් මධ්‍යසාරය පානය කළ විට ඔහු සිතන්නේ ඔහු රජෙක් කියාය, නමුත් මධ්‍යසාරයේ බලපෑම අවසන් වූ විට ඔහු සිටි තැනට නැවතත් පත් වෙයි. කෙසේවෙතත්, මෙහි ඔබට තිබෙන්නේ ආධ්‍යාත්මික කුල්මත් බවයි. අසීමිත පියා ඔබගේ ගුරුවරයා වී ඔබට උගන්වන බවත් ඔබට අහවල් දේ කිරීමට

කියා උපදෙස් ලබා දෙන බවත් ඔබ දන්නවා. ඇතැම් විට ඔබගෙන් සමහරෙකුට පුහු මානයක් තිබෙයි. මායා සිටිනවා නොවේද? ගොතන ලද ව්‍යාජ කතා පුවත් බොහෝ තිබේ, ඒ ගැන අහන්න වත් එපා. එවන් දරුවන්ට මෙහි දිගටම සිටිය නොහැකි බව බාබාට වැටහෙයි. ඔබගේ ඇතුලාන්තයේ බොහෝ සේ පිරිසිදුකම තිබිය යුතුයි. ඔය ජීවාත්ම ඉතා යහපත් විය යුතුයි. ඔබ පෙම් සබඳතාවයකින් විවාහ වී ඇත. පෙම් සබඳතාවයකින් විවාහ වූ විට එම විවාහය තුළ බොහෝ සෙනෙහස තිබේ. එම ඒකායන කෙනා සියලු සැමියන්ගේ සැමියාය. එබැවින් එක්කෙනෙක් පමණක් නොව, ඔබගෙන් බොහෝ දෙනෙකුට ප්‍රේම විවාහ තිබේ; ඔබ සියලු දෙනාම පවසන්නේ ඔබ ශිව බාබා සමග විවාහ ගිවිසගෙන ඇති බවයි. ඔබ දෙව්ලොව අසුන් ගැනීමට යනවා. මෙය විශාල සතුටට කාරණාවක්. බාබා ඔබව කෙතරම් සරසන්නේද කියා ඔබගේ ඇතුලාන්තයෙන් ඔබ සිතිය යුතුයි. ශිව බාබා මෙම කෙනාගේ (බ්‍රහ්ම) මාර්ගයෙන් ඔබව සරසයි. ඔබ නොකඩවා බාබාව සිහි කිරීමෙන් ඔබ සතෝප්‍රධාන් වන බව ඔබගේ බුද්ධිය දන්නවා. වෙන කිසිම කෙනෙක් කිසිසේත්ම මෙම දැනුම නොදනී. මේ ගැන මහා කුල්මත් බවක් තිබේ. වර්ථමානයේ ඔබට තිබිය යුතු කුල්මත් බව නොමැත. “ඔබට අතීන්ද්‍රිය සුඛය ගැන දැන ගැනීමට අවශ්‍ය නම් ඒ ගැන ගෝප් සහ ගෝපිකාවන්ගෙන් විමසන්න.” ඔබගෙන් ඇතැම් ජීවාත්ම බොහෝ කිලිටිය. එය හරියට ඔබ කසල ගොඩක් මත ඉඳගෙන සිටිනවා වැනිය. පියා පැමිණ ඔබව පරිවර්ථනය කරයි, ඔහු ඔබව නැවුම් කරයි. මිනිසුන් තම ග්‍රන්ථි වෙනස් කරගත් විට, ඔවුන් බොහෝ සතුටට පත් වනවා. ඔබට දැන් පියාව හමු වී තිබේ, එබැවින් ඔබගේ ඔරුව එතෙර වී ඇති සේය. ඔබ දැන් අසීමිත පියාට අයත් බැවින්, ඔබ ඉතා විගසින් තමන්ව නිවැරදි කරගත යුතු බව ඔබට වැටහෙයි. ඔබ ඉතා සතුටු විය යුතු අතර මේ ගැන දිවා රෑ සැලකිලිමත්ද විය යුතුයි. රණ ශූරයා ලෙස ඔබට හමු වී ඇත්තේ කවුරුන්ද කියා ටිකක් බලන්න. දිවා රෑ ඔබ මෙම සිතිවිලි වල නියැලී සිටිය යුතුයි. බාබාව පැහැදිලිව හඳුනාගෙන වටහාගන්න අය, පියාසර කිරීමට පටන් ගනී. ඔය දරුවන් දැන් සංගම යුගයේ සිටින අතර ඉතිරි සියලු දෙනා සිටින්නේ කසල ගොඩේය. කුණු කන්දල් අසල සාදා ඇති එම කුඩා පැල්පත් වල ඔවුන් වාසය කරනවා වැනිය. බොහෝ කුඩා පැල්පත් ඇත. මෙය එවිට අසීමිත බව පිළිබඳ කාරණයක්. ඔබට ඉන් මිදීමට උපකාර කිරීම සඳහා ශිව බාබා දැන් ඔබට ඉතා පහසු මගක් පෙන්වා දෙනවා : මිහිරිතම දරුවනි, මෙකල ඔබගේ ජීවාත්ම සහ ශරීර යන දෙකම අපවිත්‍ර බව ඔබ දන්නවා. ඔබ දැන් එම ලෝකයෙන් ඉවත් වී ඇත. එම ලෝකයෙන් ඉවත්ව ඇති අය ඉන්පසුව මෙම දැනුමෙන් ආලෝකණය වෙයි. ඔබට පියාව හමුවී ඇත, එබැවින් තව මොනවද? ඔබ අන් අයට විස්තර කරන්නේ ඔබට මෙම කුල්මත් බව තිබෙන විට පමණයි. පරම පියා ඇවිත්. ඔහු ජීවාත්ම වන අපව පිවිතුරු කරනවා. ජීවාත්මයක් පිවිතුරු වන විට ඔහුට ප්‍රථම පෙළේ ශරීරයක් ලැබෙයි. ඔය ජීවාත්ම දැන් අසුන් ගෙන සිටින්නේ කොහෙද කියා ටිකක් බලන්න. ඔබ ඉඳගෙන සිටින්නේ ඔබගේ පැල්පත් වල, ඔබගේ සිරුරු තුළ. මෙම ලෝකය තමෝප්‍රධාන්ය.( සම්පූර්ණයෙන් අපවිත්‍රයි). ඔබ ඉඳගෙන සිටින්නේ කුණු කසල කන්ද අසලයි. ඔබ ඉවත්ව වී ඇත්තේ කොහෙන්ද කියා ටිකක් සිතා බලන්න. පරම පියා ඔබව දැන් එම එක තැන පල්වන, අපිරිසිදු ජලයෙන් ඉවත් කරගෙන ඇත. එබැවින් ඔය ජීවාත්ම දැන් පිරිසිදු වෙයි. එවිට ඔබට වාසය කිරීමට අංක එකේ මාලිගා ගොඩ නැගෙයි. පියා ඔය ජීවාත්ම සරසා ඔබව දිව්‍යලෝකයට රැගෙන යනවා. ඔය දරුවන්ගේ ඇතුලාන්තයේ මෙවන් සිතිවිලි තිබිය යුතුයි. පියා ඔබව බොහෝ කුල්මත් කරවයි. එකමත් එක කාලයකදී ඔබ බොහෝ ශ්‍රේෂ්ඨව සිටියා. ඉන්පසුව ඔබ ක්‍රම-ක්‍රමයෙන් මේ වනතුරු වැටෙන්න පටන් ගත් අතර ඔබ දැන් පතුලටම ලගා වී ඇත. ඔය ජීවාත්ම ශිවාගේ දේවාලයේ සිටි කාලයේ ඔබ බොහෝ පිවිතුරු විය. එබැවින් ඔබ දැන් එකට එකතු වී විගසින් නැවත ශිවාගේ දේවාලයට යාමට උත්සාහ දැරිය යුතුයි. ඔය දරුවන්ට එසේ කිරීමට තරම් සෑහෙන මොළයක් නැති වීම ගැන බාබා බොහෝ පුදුමයට පත් වනවා. බාබා ඔබව ඉවත් කරගෙන තිබෙන්නේ කොහේ සිටද? මෙම පාණ්ඩව රජය ස්ථාපිත කළේ පියාය. කලක් දෙව්ලොව ලෙස තිබුණු භාරතය දැන් අපායයි. මේ සෑම දේකින්ම කියැවෙන්නේ ජීවාත්ම ගැනයි. බාබා තුළ ජීවාත්ම කෙරෙහි මහා අනුකම්පාවක් තිබේ. ඔය ජීවාත්ම දැන් සිටින මෙම ලෝකය සම්පූර්ණයෙන් තමෝප්‍රධාන්ය, මේ නිසයි, ඔබ පියාව සිහි කර මෙසේ කන්නලව් කරන්නේ, “බාබා, ඇවිත් අපව ආපසු නිවහනට ගෙන යන්න!” ඔබ මෙහි අසුන් ගෙන සිටින අතර වුවද ඔබට මෙවන් සිතිවිලි තිබිය යුතුයි. මේ නිසයි බාබා පවසන්නේ : ඔය දරුවන් වෙනුවෙන් අංක එකේ විශ්ව විද්‍යාලයක් ගොඩ නැගිය යුතුයි. එය සෑම කල්පයකදීම ගොඩ නැගෙනවා. ඔබගේ සිතිවිලි බොහෝ රාජකීය විය යුතුයි. වර්ථමානයේ ඔබට එවන් කුල්මත් බවක් නොමැත. ඔබට එවන් කුල්මත් බවක් තිබුණා නම් ඔබට මහා විශ්මයන් පෙන්වීමට හැකි වෙයි. ඔය දරුවන්ට “විශ්ව විද්‍යාලය” යන්නෙහි අරුත වැටහෙන්නේ නැහැ. එම රාජකීයත්වයේ කුල්මත් බව ඔබ පවත්වා ගන්නේ නැහැ. මායා ඔබව යටපත් කරනවා. බාබා පහදා දෙනවා : දරුවනේ, ඔබ තුළ කිසිම වැරදි අන්දමේ කුල්මත් බවක් නොතිබිය යුතුයි. ඔබට කුමන සුදුසුකම් තිබෙනවාද, ඔබ කෙතරම් ඉගෙන ගෙන උදව්

කරනවාද කියා, ඔය සෑම කෙනෙක්ම තමන්ව පරීක්ෂා කර බැලිය යුතුයි. ඔබ නිකම්ම ගොතන ලද කතා කියමින් නොසිටිය යුතුයි; ඔබ පවසන දේවල් ඔබ ක්‍රියාවට නැංවිය යුතුයි. ඔබ නිකම් මුසා කතා නොකිව යුතුයි. අද ඔබ යමක් කිරීමට යන බව කියයි. හෙට දවසේ මරණය පැමිණ, ඔබට සියල්ල සම්පූර්ණයෙන් අවසන් වෙයි. ඔබ ස්වර්ණමය යුගයේ මෙසේ නොකියයි. දිව්‍යලෝකයේ අකල් මරණ සිදුවන්නේ නැහැ. මරණයට එහි යා නොහැක. එය සතුටු දේශයයි. සතුටු දේශයට ඇතුළු වීමට මරණයට අයිතියක් නැත. ඔබ “රාවනගේ දේශය” සහ “රාමාගේ දේශය” යන්නෙහි අරුත වටහා ගත යුතුයි. ඔබගේ යුද්ධය දැන් තිබෙන්නේ රාවන සමගයි. ශරීර අවධානය බොහෝ විශ්මයන් සිදු කරයි; එය ඔබව සම්පූර්ණයෙන් අපවිත්‍ර කරයි. ජීවාත්ම අවධානයට පත් වීමෙන් ඔය ජීවාත්ම පිරිසිදු වෙයි. ඔබට එහිදි කුමන ආකාරයේ මාලිගා තිබෙයිද කියා ඔබට වැටහෙයි. ඔබ දැන් සිටින්නේ සංගම යුගයේය. ඔබ දැන් අංක පිළිවෙලට තමන්ව දියුණු කර ඔබව වටිනා බවට පත් කරයි. ඔය ජීවාත්ම අපවිත්‍ර වූ නිසා ඔබට අපවිත්‍ර ශරීර ලැබුණා. මා දැන් ඇවිත් සිටින්නේ ඔබව දෙව්ලොව වැසියන් කිරීමටයි. සිහි කිරීම තිබෙනවාත් සමගම ඔබට දිව්‍යමය ගුණධර්ම ද තිබිය යුතුයි. මෙය ඔබගේ නැන්දම්මාගේ ගෙදර යනවා වගේ නොවෙයි. බාබා පැමිණ ඇත්තේ ඔබව මනුෂ්‍යයන්ගෙන් නාරායන බවට පරිවර්ථනය කිරීමට බව ඔබට වැටහෙයි. කෙසේවෙතත්, මායා අදෘෂ්‍යමාන අන්දමකින් ඔබ සමග යුද්ධ කරයි. ඔබ අප්‍රසිද්ධ සටන්කාමීන් ලෙස හදුන්වන්නේ මේ නිසයි. වෙනත් අප්‍රසිද්ධ සටන්කාමීන් නොමැත. ඔබ සටන්කාමීන් ලෙස හදුන්වයි. අනෙක් සියලු දෙනාගේ නම් වාර්ථාවක සටහන් වෙයි. ඔවුන් ඔය අප්‍රසිද්ධ සටන්කාමීන්ගේ සංඛේතය ගෙන තිබේ. ඔබ කෙතරම් අදෘෂ්‍යමානද කියතොත් කිසි කෙනෙක් ඔබව නොහදුනයි. මායා පාලනය කිරීම සඳහා ඔබ මුළු ලෝකයම ජයගනී. ඔබ පරම පියා සිහි කිරීමට තැත් කරන විට මායා ඔබට ඔහුව අමතක කරවයි. ඔබ සෑම චක්‍රයකදීම ඔබගේම රාජධානිය ස්ථාපිත කරයි. ඔබ පියාව පමණක් සිහි කරන අප්‍රසිද්ධ සටන්කාමීන්ය. මේ සඳහා ඔබට ඔබගේ අත් පා භාවිතා කිරීමටවත් අවශ්‍ය නොවෙයි. සිහි කිරීමේ සිටීමට බොහෝ ක්‍රම බාබා ඔබට පෙන්වා දෙයි. ඇවිදින විට සහ එහෙ මෙහෙ යන එන විට ස්මරණ වන්දනා ගමනේ රැදී සිටින්න. තවද ඔබ මෙම දැනුමද හැදෑරිය යුතුයි. ඔබ සිටියේ කෙලෙසද, එමෙන්ම ඔබ දැන් පත්ව ඇත්තේ කවුරුන් බවටද කියා ඔබට වැටහෙයි. එමෙන්ම පියා ඔබව පත් කරන්නේ කවුරුන් බවටද කියාත් ඔබට වැටහෙයි. ඔහු ඔබට ඉතා පහසු ක්‍රමවේද ලබා දෙයි. ඔය ජීවාත්ම කොහේ ජීවත් වුණත්, ඔබගෙන් මළකඩ ඉවත් විය හැකි සේ, පියාව සිහි කරන්න. ඔහු සෑම කල්පයකදීම මෙම ක්‍රමය ඔබට පෙන්වයි. තමන් ජීවාත්මයක් බව සලකා පියාව සිහි කරන්න, එවිට ඔබ සතෝප්‍රධාන් වෙයි. ඔබට මෙය හැර වෙනත් බන්දනයක් නැත. ඔබ නාන කාමරයට යන විට පවා තමන් ජීවාත්මයක් බව සලකා පියාව සිහි කරන්න, එවිට ජීවාත්ම මත ඇති කසල ඉවත් කළ හැක. ජීවාත්මය මත ඔබට තිලකයක් තැබීමට අවශ්‍ය නැහැ. ඒ සියල්ල භක්ති මාර්ගයේ සලකුණුය. මෙම දැනුම මාවතේ ඒ කිසි දේකට අවශ්‍යතාවයක් නැත. ඔබට සතයක වත් වියදමක් පවා නැත. නිවසේ රැදී සිටින අතර වුවද, නොකඩවා සිහි කිරීමේ රැදී සිටින්න. එය ඉතා පහසුයි. බාබා, අපගේ පියා, අපගේ ගුරුවරයා සහ අපගේ ගුරුය. සාමාන්‍යයෙන් නීතිය වන්නේ ප්‍රථමයෙන් ඔබගේ පියාව සිහි කිරීම වන අතර ඉන්පසුව ඔබගේ ගුරුවරයා සහ පසුව ගුරුය. ඔහුගෙන් ඔබට අධ්‍යාපනයක උරුමය ලැබෙන නිසා අනිවාර්යෙන් ගුරුවරයාව සිහි කරයි. පසුව ඔබ විශ්‍රාමික වයසට ලගා වූ විට ඔබට ගුරු කෙනෙක් සිටියි. මෙම පියා ඔබට සෑම දෙයක්ම තොග පිටින් ලබා දෙයි. බාබා ඔබට තොග පිටින් උපත් 21කට රාජධානියක් ලබා දෙයි. දැරියක් විවාහ වන විට ඇයට අප්‍රසිද්ධව දෑවැද්දක් ලබා දෙයි. එය ඔවුන් පිටට පෙන්වන්නේ නැහැ. “අදෘෂ්‍යමාන පරිත්‍යාගය” සිහි කර තිබේ. ශිව බාබාද අදෘෂ්‍යමානයි. මේ ගැන අහංකාරකමක් පිළිබඳ ප්‍රශ්නයක් නැත. සමහර මිනිසුන්ට බොහෝ අහංකාරකමක් තිබෙන අතර ඔවුන්ට අවශ්‍ය, ඔවුන් දෙන දේ, සියලු දෙනා දැක ගත යුතු බවයි. මෙහි සෑම දෙයක්ම අදෘෂ්‍යමානයි. පියා ඔබගේ දෑවැද්ද ලෙස මුළු ලෝකයේම ආධිපත්‍යය ඔබට ලබා දෙයි. ඔබව බොහෝ අදෘෂ්‍යමාන අන්දමකට සරසනු ලබනවා. ඔබට අති විශාල දෑවැද්දක් ලැබෙනවා. කිසිවෙක් ඒ ගැන නොදන්නා ආකාරයකට පියා ඔබට එය ලබා දෙයි. මෙහිදි ඔබ යාචකයන් වන අතර ඔබගේ ඊලග උපතේදි ඔබගේ මුවේ රත්තරං හැන්දක් තිබෙයි. ඔබ ස්වර්ණමය යුගී ලෝකයකට යනවා. එහි සෑම දෙයක්ම රනින් නිමවී තිබෙයි. ධනවත් මිනිසුන්ට රනින් සැරසූ විශාල මන්දිර තිබෙයි. අනිවාර්යෙන් වෙනසක් තිබෙයි. මිනිසුන් දැන් වවුලන් මෙන් උඩු යටිකුරුව එල්ලී සිටින බව ඔබට වැටහෙයි. මායා ඔවුන්ට උඩු යටිකුරුව එල්ලී සිටිමට මගපාදයි. පියා දැන් පැමිණ සිටිනවා, එබැවින් ඔබ තුළ විශාල උද්යෝගයක් තිබිය යුතුයි. කෙසේවෙතත්, මේවා පරම පියාගේ උපදෙස්ද, බ්‍රහ්මගේ උපදෙස්ද, ඒවා පරම පියාගේ උපදෙස්ද, සහෝදරයාගේ උපදෙස්ද කියා, මායා ඔබට අමතක කරවයි. ඔවුන් මේ ගැන ව්‍යාකූලත්වයට පත් වෙයි. පියා පවසන්නේ : උපදෙස් හොදද නරකද කියා, ඔබ සිතුවාට කමක් නැහැ, ඒවා පියාගේ උපදෙස් බව ඔබ සැලකිය

යුතුයි; ඔබ ඒවා අනුගමනය කළ යුතුයි. ඒවායේ අත්වැරදීමක් තිබුණත්, ඔහුට එම බලය තිබෙන නිසා, බාබා එය නිවැරදි කරයි. මේ කෙනා සෑම දෙයක්ම අනුගමනය කරන්නේ කෙසේද කියා ඔබට දැක ගත හැක. ඔහුගේ හිසේ අසුන්ගෙන සිටින්නේ කවුරුන්ද? ඔහු (ශිව බාබා), ඔහුගේ (බ්‍රහ්ම බාබා) අසලින්ම අසුන්ගෙන සිටිනවා. ඔබට උගන්වන විට ගුරුන්ද, ඔවුන් අසලින්ම ඔබට අසුන් ගැනීමට සලස්වයි. කෙසේවෙතත් මේ කෙනාද උත්සාහ දැරිය යුතුයි. තමෝප්‍රධාන් බවින් සතෝප්‍රධාන් වීමට ඔහු උත්සාහ දැරිය යුතුයි. පියා පවසන්නේ : ඔබ ආහාර පිළියෙල කරන වෙලාවේ මා සිහි කරන්න. වෙනත් කිසිම කෙනෙකුට ශිව බාබාගේ ස්මරණයේ සිටිමින් ආහාර පිළියෙල කළ නොහැක. ප්‍රශංසා කෙරෙන බ්‍රහ්ම භෝජන, වත්මන් කාලයේ පිළිබඳවයි. ලෞකික බ්‍රහ්මණයන් එම ආහාර පිළිබඳව ප්‍රශංසා කරන නමුත් ඉන් අදහස් වන්නේ කුමක්ද කියා ඔවුන්ට වැටහෙන්නේ නැහැ. නිකම්ම ප්‍රශංසා ගායනා කරන අයට කිසිවක් වැටහෙන්නේ නැහැ. කෙසේවෙතත්, යම් කෙනෙක් පුදන්නෙක් නම්, ඔහු ආගමට ලැදි කෙනෙක් කියා ඔබට වටහාගත හැක. එහි, ස්වර්ණමය යුගයේදී, ආගමට ලැදි වීම පිළිබඳ ප්‍රශ්නයක් නැත, මන්ද, එහි භක්තිය නොමැති නිසා. භක්තිය යනු කුමක්ද කියා එහි සිටින කිසිවෙක් නොදනී. මිනිසුන්, ගයාන්, භක්තිය සහ වෛරාගය ගැන පවසයි. මෙම ව්‍යවහාර අංක එකේ එකකි. මෙම දැනුම දහවල වන අතර භක්තිය රාත්‍රියයි. ඔබට රාත්‍රිය කෙරෙහි වෛරාගයක් තිබෙන විට ඔබට දහවලට යාමට හැකි වෙයි. මෙය ඉතාම පැහැදිලියි. ඔබට දැන් වැටහී ඇති බැවින් ඔබ තව දුරටත් වැටී වැටී ගමන් කිරීමට අවශ්‍ය නැහැ. පියා පවසන්නේ : මා සිහි කරන්න! මා ඔබව ලෝකයේ පාලකයන් බවට පත් කරවනවා. මා ඔබගේ අසීමිත පියාය. මෙම ලෝක චක්‍රය පිළිබඳ දැනුම හැදෑරීම ඉතා පහසුයි. බීජය සිහි කරන්න එමෙන්ම වෘක්ෂය සිහි කරන්න. එය දැන් කලි යුගයේ අවසානය නිසා, ස්වරණමය යුගය පැමිණීමට ඉතා ආසන්නයි. ඔබ දැන් සංගම යුගයේ හිඳිමින් ලස්සණ මල් බවට පත් වෙනවා. ඔය ජීවාත්ම සතෝප්‍රධාන් වන බැවින් ඔබට ජීවත් වීමට සතෝප්‍රධාන් මාලිගා ලැබෙයි. මුළු ලෝකයම අළුත් වෙනවා. එබැවින් ඔය දරුවන් බොහෝ සතුට අත්විඳිය යුතුයි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. ඔබ ශ්‍රීමත් අනුගමනය කිරීමෙන් ඔබගේ සුරදූත දේශය (පරිස්ථාන්) ස්ථාපිත කරන බවට කුල්මත් බව නිරන්තරයෙන් පවත්වා ගන්න. සියලු නිෂ්ඵල දේවල් සහ කසල ඉවත් කර මහා උද්යෝගයක් පවත්වාගන්න.
2. බොහෝ රාජකීය සිතිවිලි ඇති කරන්න. ඉතා හොඳ රාජකීය විශ්ව විද්‍යාලයක් සහ නේවාසිකාගාරයක් විවෘත කිරීමට පිළියෙල කරන්න. පියාගේ අදෘෂ්‍යමාන උදව්කරුවන් වන්න; කිසිවක් පෙනුමට නොකරන්න.

**වරදානය:** අසීමිත සේවාධාරියෙක් ලෙස ඕනෑම අන්දමක සේවයක් සිදු කරන අතර ඔබගේ අසීමිත ආකල්පයෙන් චිත්ත තරංග විහිදුවා හරින්න.

දැන්, අසීමිත පරිවර්ථනයේ සේවයට තීව්‍රතාවයක් ගෙන එන්න. එය මෙසේ නොවිය යුතුයි: මා එය කොහොමත් කරනවා, මා කෙතරම් කාර්යබහුලද කියතොත් මට වෙලාවක් නැහැ. ඕනෑම අන්දමක සේවය සඳහා උපකරණයක් වන අතර, ඔබට අසීමිත ආකාරයකට සහයෝගය ලබා දිය හැක. කළ යුත්තේ ඔබගේ ආකල්පය අසීමිත බවේ තබා ගැනීම පමණයි, එවිට එම සිතිවිලි තරංග අඛණ්ඩව පැතිරී යයි. ඔබ අසීමිත බවේ, වැඩිපුර කාර්යබහුලව සිටින තරමට, ඔබගේ වගකීම් වඩාත් පහසු වෙයි. සෑම තත්පරයකදී, සෑම සිතිවිල්ලකින්ම උසස් සිතිවිලි තරංග විහිදුවා හැරීමේ සේවය සිදු කිරීම යනු, අසීමිත සේවාධාරියෙක් වීමය.

**පාඨය:** ශිව පියා සමග ඒකාබද්ධ වී සිටින ශිව ශක්තීන්ගේ අලංකාරය වන්නේ මෙම දැනුමේ ආයුධයි.

***** ඕම ශාන්ති *****